# කුඩාපාසල්වල විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ උපායමාර්ග භාවිතයේ සුවිශේෂිතා පිළිබඳ අධ්‍යයනයක්.

(දකුණු පළාත තුළ තෝරාගත් පාසල් 33ක් ආශ්‍රයෙන් සිදුකරනු ලබන අධ්‍යයනයක්)

University of Colombo
Sri Lanka
03 AUG 2015
Examination Branch
Colombo - 03

UCLIB
586101

University of Colombo
Library
Sri Lanka

සුජීව ප්‍රසන්න වීරතුංග වාකිෂ්ය.
**2010/M Phil /S/12,**

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පියයේ අධ්‍යාපන දර්ශනපති පායමාලාව සඳහා
ඉදිරිපත් කරන ස්වාධීන පර්යේෂණ නිබන්ධය.

2015

## සාරාංශය

වාකිෂ්ය, එස්.පි.ඩබ්ලිව්.(2014) කුඩා පාසල්වල විදුහල්පතිවරුනේග් කළමනාකරණ උපායමාර්ග භාවිතයේ සුවිශේෂිතා පිළිබඳ අධ්‍යයනයක් , අධ්‍යාපන දර්ශනපති උපාධිය, කොළඹ විශ්ව විද්‍යාලය.

ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ''කුඩා පාසල'' ක්‍රමිකව වැයීයාමෙ හා බෙලහීන තත්ත්වයකට පත්ව යාම වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාව වුවත් එම පාසල් සන්දර්භයේම ක්‍රියාත්මක වන ඇතැම් කුඩා පාසල් සුවිශේෂී වර්ධනීය ලක්ෂණ පෙන්වමින් ක්‍රමිකව සංවර්ධනය කරා ගමන් කරන ස්වභාවයක් දක්නට ලැබේ. මෙම සුවිශේෂී කුඩා පාසල් එසේ ක්‍රමික සංවර්ධනය කරා ගමන් කරන්නේ කෙසේද යන්නත්, ඒ සඳහා එම පාසල් වල විදුහල්පතිවරුන් භාවිතයට ගනු ලැබූ කළමනාකරණ උපායමාර්ග මොනවාද යන්නත්, එම උපායමාර්ග කුමන වාතාවරණයක් යටතේ කෙසේ ක්‍රියාත්මක කරනු ලබයිද යන්නත් ගැඹුරින් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අධ්‍යයන ප්‍රස්තුතය විය.

අධ්‍යයනය මතු දැක්වෙන ප්‍රධාන අරමුණු ඔස්සේ ක්‍රියාත්මක කරන ලදි.

1. කුඩා පාසල් සැලසුම්කරණය සඳහා විදුහල්පතිවරුන් විසින් අනුගමනය කරනු ලැබූ උපාය මාර්ග භාවිතයේ සුවිශේෂතා පිළිබඳව විමසා බැලීම.
2. පාසල් මට්ටමේ සම්පත් කළමනාකරණය උදෙසා විදුහල්පතිවරුන් විසින් භාවිතයට ගනු ලැබූ උපාය මාර්ග භාවිතයේ සුවිශේෂතා පිළිබඳව අනාවරණය කර ගැනීම.
3. කුඩා පාසල්වල විදුහල්පතිවරුන් තම පාසලේ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානයේදී අනුගමනය කරනු ලැබූ උපාය මාර්ග භාවිතයේ සුවිශේෂතා පිළිබඳව හඳුනා ගැනීම.
4. කුඩා පාසල්වල ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සඳහා ප්‍රජා දායකත්වය ලබා ගැනීමට විදුහල්පතිවරුන් අනුගමනය කරනු ලැබූ උපාය මාර්ග භාවිතයේ සුවිශේෂතා පිළිබඳව නිරීක්ෂණය කිරීම.

අධ්‍යයනයේ පර්යේෂණ ක්‍රමය වූයේ විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය යටතේ සම්මිශ්‍රිත ක්‍රමයයි. (Mixed Method) පර්යේෂණ අරමුණු වලට සමගාමීව අනුපිළිවෙලින්, සැලසුම්කරණය පිළිබඳ න්‍යායාත්මක රාමුව තුළ පාසල් සැලසුම්කරණයේ මූලිකාංග 8ක් පිළිබඳව ද , කුඩා පාසල් ආශ්‍රිත සම්පත් කළමනාකරණයේ මූලිකාංග 07ක් සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් මූලිකාංග 06ක් ද, පාසල් ප්‍රජා සම්බන්ධතා විෂයෙහි මූලිකාංග 08ක් පිළිබඳව පර්යේෂණයේ ප්‍රමාණාත්මක පාර්ශ්වය ඔස්සේ අවධානය යොමු කරනු ලැබූ අතර, එකී සාධක ප්‍රායෝගිකව භාවිතා කරන්නේ කෙසේද යන්න පිළිබඳවත් පාසල් තුළ හා පාසල් අතර දක්නට ලැබෙන සුවිශේෂිතා මොනවාද යන්න පිළිබඳවත් පර්යේෂණයේ ගුණාත්මක පාර්ශ්වය ඔස්සේ ගැඹුරින් විමසා බැලීම සිදුකර ඇත.

මෙම පර්යේෂණය දකුණු පළාතේ ක්‍රියාත්මක වන කුඩා පාසල් සඳහා පමණක් සීමා කරනු ලැබූ අතර අධ්‍යයනයේ නියැදිය සඳහා දකුණු පළාත තුළ සහේතුකව තෝරා ගනු ලැබූ පාසල් 33ක් සමීක්ෂණය සඳහා යොදාගන්නා ලදි. අධ්‍යයනය පියවර 2 ක් ඔස්සේ ක්‍රියාවට නංවන ලදී. පළමු පියවර සහේතුකව තෝරාගත් පාසල් 33 සමීක්ෂණයට ලක්කළ අතර දෙවන පියවරේදී සහේතුකව තෝරාගත් පාසල් 04 ක් සිද්ධි අධ්‍යයනය සඳහා යොදා ගන්නා ලදී. දත්ත එක්රැස් කිරීමේදී ප්‍රමාණාත්මක දත්ත ලබා ගැනීම සඳහා සමීක්ෂණ ප්‍රශ්නාවලිය භාවිතා

කළ අතර ගුණාත්මක දත්ත එක්රැස් කර ගැනීම සඳහා අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා , ඉලක්ක කණ්ඩායම් සාකච්ඡා, නිරීක්ෂණය හා ලේඛන විශ්ලේෂණය යන ක්‍රම අනුගමනය කරන ලදී. දත්ත ලබා ගැනීම සඳහා නියැදියේ විදුහල්පතිවරුන් 33ක් යොදාගත් අතර, සිද්ධි අධ්‍යයනය සඳහා යොදාගනු ලැබූ පාසල් වල ගුරුභවතුන් හා දෙමාපියන් 10 බැගින් පාසල් 04 න් 40 දෙනෙක් ද යොදා ගනු ලැබීය.

ලබාගත් දත්ත ආකාර 02කට විශ්ලේෂණය කිරීම සිදුකර ඇත. ප්‍රමාණාත්මක දත්ත, වගු හා ප්‍රතිශත වශයෙන්ද ,ගුණාත්මක දත්ත භූමිගත න්‍යාය පදනම් කරගත් තේමා ආශ්‍රිත විශ්ලේෂණ ක්‍රමය හා අන්තර්ගත විශ්ලේෂණය (Grounded Theory, Thematic Analysis and Content Analysis) උපයෝගී කරගෙන විශ්ලේෂණය කර ඇත. ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත පදනම් කරගත් අවසන් විශ්ලේෂණය හා විස්තරාත්මක සිද්ධි අධ්‍යයන වාර්තා හා හරස් සිද්ධි අධ්‍යයන විශ්ලේෂණ පදනම් කරගෙන අවසන් නිගමන දක්වා ඇත.

අධ්‍යයනය තුළින් මතු දැක්වෙන කරුණු අනාවරණය කරගෙන ඇත. කුඩා පාසල් සැලසුම්කරණය, සම්පත් කළමනාකරණය, විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ පාසල් ප්‍රජා සම්බන්ධතා යන ක්ෂේත්‍ර වල අනුගමනය කරනු ලබන සුවිශේෂී උපායමාර්ග සහ එම උපායමාර්ග ක්‍රියාත්මක කරනු ලැබූ පාසල් සංස්කෘතිය පිළිබඳව ගැඹුරින් කරුණු ආනාවරණ කර ඇත. අධ්‍යයනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක දත්ත හරහා අපේක්ෂිත ප්‍රධාන තේමා 04ක් සහ අනපේක්ෂිත තේමා 04ක් හඳුනාගත හැකිවිය. ඒ ඔස්සේ අධ්‍යයනයේ අවසන් නිගමන ලබාගත හැකිවිය.

විධිමත් පාසල් සැලසුම්කරණය, පාසලේ සම්පත් උපරිම ලෙස ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතය , මානව සම්පත් කළමනාකරණය, සක්‍රිය ප්‍රජා සම්බන්ධතා ජාලයක් පවත්වාගෙන යාම, ප්‍රධාන උපායමාර්ග ලෙස අධ්‍යයන නියැදියේ සියලු පාසල් ක්‍රියාත්මක කර ඇත. කළමනාකරණ බාධාවන් තුළින් මතු කර ගත් නව කළමනාකරණ සංස්කෘතිය, විදුහල්පතිවරයාගේ නායකත්ව රටාවන් හා ගුණාංග, පාසලේ පාර්ශ්වකරුවන්ගේ සක්‍රිය දායකත්වය සහ පාසලෙන් පරිබාහිර ආයතන පාසල් වෙත දක්වන උනන්දුව යන සාධක පොදුවේ හඳුනාගත හැකි සාධක වශයෙන්ද නිගමනය කළ හැක. පාසලේ ක්‍රියාත්මක සංස්කෘතිය හා සමාජ පරිසරයට අනුගත වන ආකාරයට හා එම පාසල් අනන්‍යවූ සංස්කෘතියට අදාළව නිර්මාණශීලීව හා ආවේණික වූ කළමනාකරණ උපායමාර්ග පාරිසරික, සංස්කෘතික ,සමාජීය හා ආර්ථික වටපිටාවට ගැළපෙන පරිදි නිර්මාණශීලීව ගොඩනගා ගෙන තිබෙන බවත්, මෙම සියලු සාධක වටා බැඳුණු නිර්මාණශීලී නායකත්ව ලක්ෂණ හොඳින් ඉස්මතුවන බවත්, අවසන් විග්‍රහයේදී හඳුනාගත හැකිවිය. එකී සාධක පාසල ප්‍රගමනය කරා මෙහෙයවනු ලබන ප්‍රධාන බලවේගය වන බව අනාවරණය කරගත හැකිවිය.

අධ්‍යයනය සහේතුක නියැදියක් හරහා සිදුකරනු ලැබූවක් වන බැවින් නිගමන සාමාන්‍යකරණය කළ හැකි වන්නේ අදාළ නියැදියට පමණි. එසේ නමුත් අනාවරණය කරගනු ලැබූ සන්දර්භගත ලක්ෂණ හා කළමනාකරණ උපායමාර්ග අනෙකුත් කුඩා පාසල්වල කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම සඳහා භාවිතයට ගත හැකිවේ.

කුඩා පාසල් සාර්ථකව පවත්වාගෙන යාම සඳහා එම පාසල් හා සෘජුවම සම්බන්ධ වන පාර්ශ්වයන්ට සහ කුඩා පාසලේ ක්‍රියාකාරිත්වයට වක්‍රව සම්බන්ධ වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ කටයුතු වඩාත් සාර්ථක කරගැනීමට ඉවහල්වන සංවර්ධනාත්මක යෝජනා අධ්‍යයනය මඟින් ඉදිරිපත් කර ඇත.

## Summary

A study on specialties of Management strategies used by the Principals in small schools. Wakishta, S.P.W. (2014). Master of Education Philosophy Degree, University of Colombo.

Though the current tendency is a gradual closure and frailty of small schools in school education system in Sri Lanka, it is visible some small schools which operate in the same context showing distinct developing features, approach a gradual development.

The main subject of thought of this study is to do a deep study as to how; these special small schools approach a gradual development, what management strategies the principals follow to make so? And in which environment, are these strategies being implemented?

The study has been implemented focusing on following objectives.

1. Surveying the specialties of usage of strategies used in small school planning by the Principals.
2. Exposure to the specialties of usage of strategies in managing resources at school level.
3. Identifying the specialties of usage of strategies in organizing co-curricular activities by the Small school Principals.
4. Observing the specialties of usage of strategies followed by the Principals in obtaining community Contribution to plan school activities.

Research method used in this study was Mixed Method system under descriptive research approach. Concurrent to the aims at mixed method research, a deep study was done sequencing, about 08 basic components of school management within the theoretical frame of Planning, seven (07) basic components of resource management, and 06 basic components regarding co-curricular activities related to small schools, 08 basic components of school community relations subject, focusing quantitative aspect of research. Moreover, a deep survey was done focusing qualitative aspect of research on practical usage of data found, and the specialties seeing, in school and among schools.

This research was limited to the small schools operating in Southern Province. 33 schools were selected purposively as the sample study. This was done in two stages. The first stage being surveying 33 purposively selected schools and the second, 04 schools, were subjected to do case studies. A questionnaire was used to collect quantitative data while a semi structural Interview was used to collect qualitative data in collecting data. Focus group discussions and document analysis too were followed. In data collection 33 principals of the sample group, and 10 each, of teachers and parents who were subjected to the case study were used.

The data obtained were analyzed by using two analytical methods; the quantitative and the qualitative data using charts and percentages, and Thematic Analysis and Content Analysis based on Ground Theory respectively. Final conclusion has been stated based on the final analysis based on quantitative and qualitative data and descriptive case study reports and cross case study analysis.

The following facts were revealed through the study. Cultural related facts have been revealed in depth while adapting specific strategies in the fields of school community relations, co-curricular activities, resource management, and small school planning. Final conclusion was obtained by identifying 04 main expected themes and 04 unexpected themes through quantitative and qualitative data. Factors such as well-organized school planning, usage of school resources in maximum productivity and efficiency, human resource management, and maintaining active community relationships have been implemented as major strategies by all the schools in the study sample. The new management culture protrudes through management conflicts, leadership styles and qualities of the principal, active contribution of the school stakeholders, and the concern the outside establishments have towards the school, can be concluded as common main factors. Those schools have established innovative and inherent strategies ingeniously according to their cultural, social and economic situation adapting to the social and cultural environment operates in the school. In the final analysis it was identified that Creative leadership qualities revolved around these facts immerge successfully. It was revealed that these facts were the main driving force directing the school towards progress.

Since the study was done through a purposive sample the generalization of the conclusion can be done only to that particular sample. Nevertheless, the revealed contextualized features and management strategies can be used to management development in other small school.

Constructive proposals have been presented to make the work of the parties directly and indirectly involved in small school activities fruitful, in order to maintain small schools successfully.